# කිරීටයෙන් කුරුසයට ............

# රිදී 30ට වහලෙක් වූ එතුමෝ

## විශේෂ පාස්කු ප්‍රකාශනය

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ මෙහෙවරකි

වර්ෂ 2025 ක් වූ අප්‍රේල් මස 18 වෙනි සිකුරාදා





**අතිඋතුම් හැරල්ඩ් ඇන්තනී පෙරේරා**
**රදගුරු හිමිපාණෝ**
සභාපති- ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය.
වයඹ පළාත් - කුරුණෑගල
කතෝලික රාජගුරුප්‍රසාදීන් වහන්සේ

**පාස්කුව නම් අප සමිදාණන්ද, නායකයානන් ද වන ජේසුස් ක්‍රිස්තු ස්වාමිදරුවන් මළවුන්ගෙන් උත්ථාන වීමේ මංගල්‍යයි.**

මෙය සභාවේ පැරණිතම හා ශ්‍රේෂ්ඨතම මංගලෝත්සවයයි. ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය අපගේ විශ්වාසයේ පදනමයි. ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන නොවූ සේක් නම්, අපගේ ඇදහිල්ල නිශ්ඵල බව ශුද්ධ වූ පාවුළු තුමන් විසින් කොරෙන්තිවරුන්ට ලියූ පළමු ලිපියෙහි සඳහන් වෙයි. (1 කොරෙන්ති 15:20) උන්වහන්සේ උත්ථානයට පෙර දුක්විඳ උකුත්වීම සිදු වුනි. අප අපගේ පාපිෂ්ඨ භාවයට නැසී, උත්ථානයේ ප්‍රීතිය භුක්ති විඳීම දෙවියන් වහන්සේගේ කැමැත්තයි.

ක්‍රිස්තුස් වහන්සේ ගෙන් පමණක් ලැබෙන ප්‍රීතිය හා සාමය අපට අත්දැකීමට හැකිවනුයේ අපගේ පව්වලට නැසීයාමෙන් පමණකි. චතාරික කාලය තුලදී උපවාස කිරීමටත්, යාච්ඤා කිරීමට හා දානමය කටයුතුවල යෙදීමටත් ශුද්ධ වූ සභා මාතාව අපව උනන්දු කරවයි. මෙවැනි ක්‍රියාවල යෙදීමෙන් අපගේ ආත්මාර්ථකාමීත්වය මර්ධනය කර ගැනිමට අපට ශක්තිය ලැබෙයි. ආහාර සීමා කිරිමෙන් හා සැප සම්පත් වලින් ඈත්වී සිටීමෙන්, දුක්විඳින අපගේ අසරණ සොයුරු, සොයුරියන්ගේ වේදනාව වටහා ගැනීමට අපට හැකිවනු ඇත.

තවත් පසෙකින් බලන විට, පාස්කු මංගල්ලයේදී අප ස්මරණය කරන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විඳීම, මරණය, විජයග්‍රාහී උත්ථානය මඟින් මුළු මහත් මිනිස් සංහතියම පාපයෙන් එතෙර කිරීමයි. එවැන්නක් තුළ මිනිසාට ශුද්ධත්වයේ ඉදිරි ගමනට ඇරයුම් කිරීමයි.

එම නිසා පාස්කු මංගල්‍යය කිතුනුවන්ට ආශිර්වාදලත් මංගල්‍යයකි. ජයග්‍රාහි මංගල්‍යයකි. පසුගිය වසරේ අප මැතිවරණ වටපිටාවක් තුළ ජීවත්වූවත්, මේ වසරේ පාස්කු මංගල්‍ය පැවැත්වෙන්නේ සාමකාමී වාතාවරණයකයි. කෙසේ වෙතත්, පාස්කු ඉරුදින ප්‍රහාරයට වසර 06ක් ගතවන මේ වසරේ කිතුනුවන්ට සහ පාස්කු වින්දිතයන්ට සාධනීය සාධාරණයක් ලබා දෙන මංගල්‍යක් වේවා! යි අපගේ විශ්වාසයයි.

ජිවිතයේ දුක් කරදර අපට පසුබටවීමට අවස්ථා නොවන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානය අපට බලාපොරොත්තුව සහ ශක්තිය ලබා දෙන නිසාය. කල්කටාවේ ශුද්ධ වූ තෙරේසා මව්තුමිය සිය සොහොයුරිය අමතා පැවසුවේ ''පාස්කුවේ ප්‍රීතිය කිසිදාක අමතක කරන්න එපා.'' යනුවෙනි. එමෙන්ම සාන්ත අගොස්තීනු මුනිඳුන් පැවසුවේ ද, ''අප පාස්කුවේ ජනතාවකි. ආලේලූයියා අපගේ ගීතයයි''. ආලේලූයියා යන හේබ්‍රෙව් වචනයේ අරුත නම් ''සමිඳාණන් වහන්සේට ප්‍රශංසා කරන්න'' යන්න යි. එය වේදනාවේ අත්දැකීමක් ද එය ප්‍රීතියේ අත්දැකීමක් ද , ඒ සියල්ල හමුවේ අප දෙවිඳුන්ට ප්‍රශංසා කරන ජනතාවකි. පාස්කු දිනය උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේගේ විමුක්ති දහම තුළ අප හැම ක්‍රියාකිරීමෙන් මේ මංගල්‍යය අර්ථවත් කර ගත හැකිය.



**පාස්කුව යනු කිතුනුවන්ගේ අති ශ්‍රේෂ්ඨ මංගල්‍යයයි.**

**අතිඋතුම් මැක්ස්වෙල් සිල්වා**
**සහයක රදගුරු හිමිපාණෝ**
සභාපති- ජාතික කතෝලික සන්නිවේදන කොමිසම

ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය, මරණය සහ උන්වහන්සේගේ ජයග්‍රහණයේ උත්ථානය යි. මෙයින් ප්‍රකාශ වන්නේ, කිතුනු ඇදහිල්ල රඳා පවතින්නේ මෙන්න මේ උත්ථානය මතයි.

කිතුණුවන් වන අප සැම දෙන එම නිසා මේ උත්ථානයේ සිද්ධිය මතයි ගොඩ නැගී තියෙන්නේ.

අද කෝටි 140ක් වන කතෝලික ජනතාවත්, තවත් විශාල සංඛ්‍යාවක් වන ක්‍රිස්තියානි ජනතාවත් මේ උත්ථානයේ සිද්ධිය මතයි ගොඩ නැගී තිබෙන්නේ.

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව මේ වසරේත් අන්තර්ජාලය ඔස්සේ පළ කරන ඩිජිටල් පාස්කු කලාපය වෙනුවෙන් අප සුභ පතන අතර මේ තුලින් සැම දෙනාටම උත්ථානයේ අභිරහස යනු කුමක්ද කියා යම් අවබෝධයක් ලබා ගැනීමට මෙම ප්‍රකාශනය හේතු වන්න වේවා කියා මම ප්‍රර්ථනා කරන අතර ඔබගේ සැම කටයුත්තක්ම උත්ථානයේ ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් සාර්ථක වේවා. ආලේලූයා! ආලේලූයා! කියා මම ප්‍රාර්ථනා කරමි.



**ගරු සුජීතර් සිවනායගම්**
**දේවගැතිතුමා**
මහ ලේකම් - ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය

කිතුනු ජනතාව මේ කාලය තුළ ක්‍රිස්තුන් වහන්සේ මානව සංහතිය පාපයෙන් මුදාගැනීමේ චේතනාවෙන් කුරුසියේ දුක්විඳ ඉතා වේදනාකාරී මරණය පරාජය කර නැවත නැගිට විමුක්තිය අත් කර දීම මෙනෙහි කරති.

බහුවාර්ගික සමාජයක් ලෙස ජීවත්වන අප අද රට ඉදිරියේ ඇති අභියෝග ජය ගැනීම වෙනුවෙන් එකමුතුව කටයුතු කිරිම අත්‍යාවශ්‍ය වේ.

පාපය විසින් ප්‍රේමය යටපත් කළද ප්‍රේමය විසින් නැවතත් ප්‍රේමය ජීවත් කරනු ලැබූහ.

ජේසුස් වහන්සේ එදා දේශනා කළ මානව විමුක්තිය සමාජයට ශක්තියකි. අද ලෝකය හමුවේ මුහුණ පෑමට සිදුවන බහුවිධ තාඩන පීඩන පරාජය කර නැගී සිටීමටත් ප්‍රේමයෙන් දයාවෙන් යුතු මානව හිතවාදී සමාජයක් තුළ ජීවත්වීමටත් මේ පාස්කු සමය ආශිර්වාදයක් කරගනිමු.

**සැමට සාමකාමී පාස්කු මංගල්‍යයක් වේවා !**



## පාස්කු මංගල්ලයය තුළින් ආදර්ශවත් ජීවිතයක් කරා

**ආචාර්ය හරිනි අමරසූරිය**
**අග්‍රාමාත්‍ය**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික
සමාජවාදී ජනරජය

සමස්ත ලෝකවාසී මෙන්ම ශ්‍රි ලංකාවේ වෙසෙන අප සහෝදර කිතුනු ජනතාව තම ශාස්තෘවරයාණන් වහන්සේ වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මරණය පරාජය කොට උත්ථාන වීම සිහි කිරීම සඳහා පාස්කු මංගල්‍යය සමරනු ලබයි.

ආර්ථික, සමාජීය හා අධ්‍යාත්මික වශයෙන් සිදුවන පරිවර්තනීය වෙනසක් සමඟ අප ඉදිරියේ ඇති අභියෝග ජය ගැනීම වෙනුවෙන් එකමුතුව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වන මෙවන් යුගයක එළැඹි පාස්කු මංගල්‍යය වඩාත් වැදගත් වන බව සිහිකරනු කැමැත්තෙමි. අප සහෝදර කිතුනු ජනතාව මෙම වැදගත් දිනය සමරනු ලබන්නේ සිය ලබැඳියන්ගේ මතකයන් ද සිත තුළ රඳවාගෙන බැවින් ඔවුන ද මෙම අවස්ථාවේ සිහිකිරීමට කැමැත්තෙමි.

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තම ජීවිතය පරිත්‍යාග කර ලබා දුන් ආදර්ශය හා පෙන්වා දුන් ජීවන ක්‍රමය ගැඹුරින් අධ්‍යනය කරමින් අප බලාපොරොත්තු වන අධ්‍යාත්මික ශක්තිය ලබා ගැනීමට හැකිවේවා! යි මම ප්‍රාර්ථනා කරමි.



## අපේත්, රටේත් අනාගතයට සුභ ලකුණු දල්වන ප්‍රාතිහාර්යාත්මක දිනයක් වේවා.

**ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි**
**අමාත්‍ය**
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු
අමාත්‍යාංශය

කල්වාරි කන්දේ දී රෝමවරුන් විසින් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ව කුරුසියේ තබා ඇණ ගැසීමෙන් දින තුනකට පසු උන්වහන්සේ ගේ උත්ථානය සිදු වූ අතර එකී අවස්ථාව සමරමින් සකල ලෝකවාසී කිතුනු ජනතාව පාස්කු මංගල්‍යය පවත්වනු ලබයි.

ලෝකාන්ධකාරය හා නපුර දුරු කොට, යහපත පිළිබඳ අපේක්ෂාව හා බලාපොරොත්තුව ගෙන එමින් සිදු වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ උත්ථානය නමැති උන්වහන්සේ ගේ බලය ප්‍රකාශ වන මහා ප්‍රාතිහාර්ය සමරන මේ දිනය, අපට ද අපේ ජීවිතාන්ධකාරය පලවා හැරීමට ඇරයුම් කරයි.

ප්‍රේමය ම තමාගේ ආගම කරගත් සහෝදර කිතුනු ජනතාව, මේ දිනය සකල ලෝකවාසී සත්ත්වයන්ටම ප්‍රේමය පැතිරවීමේ දිනය බවට පත්කර ගනිති. මෙය අපේක්ෂාවේ දිනයකි. ඉතා අඳුරු කාල පරිච්ඡේද ගත කරන විට පවා, සිතට දිරි සවි ලබා දෙන දිනයකි. ඊට ඉත සිතින් සුබ පතමු.

එමෙන් ම 2019 අප්‍රේල් 21 දින සිදු වූ කටුවාපිටිය දේවස්ථානය ප්‍රමුඛව එල්ල වූ පාස්කු දින ත්‍රස්තවාදී ප්‍රහාරය පිළිබඳ අවංක කනගාටුව හා ශෝකය පළ කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි. එම පරීක්ෂණ නිසි ලෙස හා විධිමත්ව සිදුකිරීමට අපගේ රජය කැපවෙන්නෙමු. ඒ හරහා වින්දිතයන්ට යුක්තිය ඉටු කිරීම මෙන් ම චූදිතයන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම නුදුරු අනාගතයේ දීම සිදුවනු ඇත.

දේව පණිවුඩය අප වෙත ගෙන ආ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ මේ ප්‍රාතිහාර්ය දිනය, අපේත්, රටේත් අනාගතයට සුබ ලකුණු දල්වන ප්‍රාතිහාර්ය දිනයක්ම වේවා! යි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි. ජේසු පිහිටයි!



## ක්‍රිස්තුස් වහන්සේගේ යහපත් හේවායෙකු මෙන් දුක් විඳීමට පංගුකාරයෙක් වන්න.

**ප්‍රින්ස් සේනාධීර**
**ලේකම්**
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු
අමාත්‍යාංශය

කතෝලික සභාවේ ජන වන්දනා වසර තුල ක්‍රිස්තුස් වහන්සේ ගේ උපත සැමරීමේ උළෙල (නත්තල) සහ ක්‍රිස්තුස් වහන්සේ ගේ උත්ථානය සමරන පාස්කු මංගල්‍යය ප්‍රධාන තැනක් ගනී. නත්තල සූර්ය කේන්ද්‍රව සමරන අතර පාස්කු මංගල්‍යය චන්ද්‍ර කේන්ද්‍රව සමරනු ලබයි. කිතුනු ජනතාව ගේ අති උතුම්ම මංගල්‍යය ලෙස සලකන මේ ප්‍රසාදජනක සමයේ ක්‍රිස්තුස් වහන්සේ ගේ දුක් විඳීම, උකුත් වීම, උත්ථානය මෙනෙහි කරමින් උන්වහන්සේ ගේ නැවත පැමිණීමේ බලාපොරොත්තුව ඇතිව සැදැහැවත් කිතුනු ජනතාව තම ජීවිත ආලෝකය කරා ගමන් කරයි. විශේෂයෙන් ම කිතුනු සභාවේ සාක්ෂි දරමින් ජීවිත පූජා කළ ප්‍රාණපරිත්‍යාගවරුන් ගේ ජීවිත වලින් පාස්කු මංගල්‍යයේ නියම අරුත උකහා දක්වයි. එලෙස ම ක්‍රිස්තුස් වහන්සේ මනු බව ලබා ගෙන පාපය පරාජය කිරීම සඳහා ඒ හෙලූ සෑම ශ්‍රි රුහිර බිංදුවකටම අප ද පංගුකාරයන් ලෙස අප අතරින් ම සැබෑ දෙවියන් වහන්සේ සඳහා සාක්ෂි දරමින් සිට ස්වර්ගස්ථ වූ සෑම ප්‍රාණපරිත්‍යා ගීවරයෙකු ගේ ඒ ලේ බිංදුවක් පාසා ම අප ද සාක්ෂි දැරිය යුතු ය. සැබෑ පාස්කුවේ රහස මනස්ථාපනය වෙමින් සත්‍යට සාක්ෂි දැරීමයි.

"ක්‍රිස්තුස් වහන්සේ ගේ යහපත් හේවායකු මෙන් දුක් විඳීමට පංගු කාරයෙක් වන්න." (2 තිමෝති 2:3)

ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ ආරාධනා කරන ලෙස ම උන්වහන්සේ ව අනුග මනය කරන හේවායකු වන්නට ඔබටත් ආරාධනා කරමින් උත්ථාන වූ ජේසුස් වහන්සේ තුළ ශක්තිමත් ව සත්‍යය උදෙසා සාක්ෂි දරන්නට හැකි වන පාස්කු මංගලයයක් වේවා! යි ප්‍රාර්ථනා කරමි.



## දේව ආශිර්වාදය පිරි සුබ පාස්කු මංගල්‍යයක් වේවා

**එම්. චතුරි පින්තු**
**අධ්‍යක්ෂ**
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

සකල ජනයා පාපයෙන් මුදවාගන්නට දිළිඳු ගවලෙනක ඉපිද සාමාන්‍ය ජනයා අතර හැදී වැඩුනු ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කිසිදු පාපයක් සිදු නොකර අනුන්ගේ පාප වලට වන්දි ගෙවීමට කෘරතර වද හිංසා වලට ගොදුරු වෙමින් දුක්ඛිත මරණයකට මුහුණ පෑ සේක. අළු බදාදා දිනයෙන් ආරම්භ වන චතාරික සමය ලෝකවාසී සියලු කිතුණුවන්ට අතිශයින් වැදගත් කාල පරිච්ඡේදයක් වන්නේ එය වරප්‍රසාදීය කාල පරිච්ඡේදයක් ලෙස කිතුණුවන් සලකන බැවිනි.

විවිධ චතාරික භක්ති අභ්‍යාස වල නියැලෙමින් වසරේ අනෙකුත් කාල සීමාවන්ට සාපේක්ෂව ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතාදර්ශය වඩාත් සමීප වන්නට මෙම කාල සීමාවේ දී කිතුණුවන්ට අවකාශය හිමි වේ. පාදනමස්කාර, ශුද්ධවූ පැය, පසම් හා ලතෝනි ගායනය, පශ්චත්තාපික මෙහෙයන් ආදියෙන් ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විදීමට ඒකාත්මික වීමට කිතුණු ජනතාවට අවකාශ හිමිවෙන මෙම කාල පරිච්ඡේදය සැබවින් ම වරප්‍රසාදයෙන් පූර්ණ වූ කාල සීමාවකි.

කිතුණුවන් වශයෙන් අප සැම දෙන මෙම චතාරික කාලයට පමණක් සීමා නොවී අපගේ මුළු ජීවිත කාලය තුල ම ක්‍රිස්තුස් වහන්සේ ගේ දුක් විදිම මෙනෙහි කරමින් අපගේ පාප ක්‍රියා තුලින් උන්වහන්සේගේ කුරුසියෙහි බර තව තවත් වැඩි නොකර, පාපයෙන් ඈත් වී ජේසුස් වහන්සේට ආදරය කිරීමට මෙම පාස්කු මංගල්‍යයේ දී සිතට ගනිමු.

**ඔබ සැමට සුභ පාස්කු මංගල්‍යයක් වේවා**

## මුළු ජීවිතෙ පුරාවටම චතාරිකයෙ කල් ගෙවන්න

ගිනි ගහනා මද්දහනේ
කුරුස බරත් දරාගෙනම
ජේසු නැග්ගෙ කල්වාරියෙ
බර පාපෙන් අප මුදන්න......................

මහ සිකුරාදට පමණයි
අපේ සිතට දුක දැනෙන්නෙ
ජේසු වින්ද සියලුම දුක්
ඉන්පසු අමතක වන්නේ.....................

සතුටෙන් ජීවිතෙ ගෙවනවා
මහ පව් ගොඩකුත් කරනවා
ජේසු කුරුසෙ වින්ද දුකත්
නිසැකව අමතක කරනවා...................

අළු තවරන බදාදා සිට
ගෙවෙනා තෙක් චතාරිකය
නොවේ මුළු ජීවිතෙ පුරාවටම
චතාරිකයෙ කල් ගෙවන්න.............

ජේසුතුමා පැවසු ලෙසම
එතුම පස්සෙ කුරුස දරන්
යන්නට අදිටන් කරමුව
මේ චතාරිකයෙ වත් අප සැම.......................



**ඩිලිෂියා තිලකරත්න**
"නිශාමිණී"
වල්දෙනිය, කෑගල්ල

කිතු සමිඳා දුගියකු සේ
ඉපිද එදා ගව මඩුවේ
ලොවට විමුක්තිය දෙන්නට
දිවි පිදුවා කුරුස ගසේ

එවන් රුදුරු දුක අපගේ
සිතින් මැකී ගොස් මෙකලේ
දනෝ ගිලෙත් පව් අඳුරේ
අපා දොරටු දසත පෙනේ

වංචා දූෂණ බෝවී
දෙව් පෙම සිඳ මත් රසයේ
වහලුන් වී ලොව කළඹා
සියතින් සිය ගෙල සිඳිති

සත්මග සුර පෙම පෙන්නා
පාප දොරටු අඟුළු දමා
කුරුසෙට බිලි වූ සමිඳා
යළි කුරුසෙට යවනු එපා

උත්තම රුහිරේ අනුහස්
අමතක කොට ජුදස් වගේ
ගොස්, අප ගැල වූ උතුමා
යලි කුරුසෙට යවනු එපා



**චාමර හෙට්ටිආරච්චි**
සහෝදරතුමා

පරිගණක පිටු සැකසුම
**අජිත් මෙන්ඩිස්**

**ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි**

# සැබෑ චතාරිකයක් අත්දකිමු

**කාමන් සකුන්තලා**
විලගෙදර

කුරුසිය අපගේ ගැලවීමේ සංකේතයයි. අද මිනිසා ලේසි පහසු මාර්ග භාවිතා කර ගැලවීම සොයයි. කුරුසිය බාරගෙන උසුලා ගෙන යාම ප්‍රතික්ෂේප කරයි. කිතු තුමන් කුරුස ගසේ ජීවිත පූජා කරමින් සැම දෙනාව ම පාපයෙන් නිදොස් කළා සේ, අප සැබෑ කිතුනුවන් වන්නට නම් අන් අයගේ ආත්ම දිනා ගන්නට ගලවා ගන්නට වෙර දරන ජීවිත කැප කරන පූජා කරන ජනතාවක් විය යුතුයි.

සැබෑ කිතුනුවන් වන්නට වත්පිලිවෙත් වලට පමණක් සීමා වූ ජීවිතයෙන් බැහැර වූ නැති වුන බැටළුවන් සොයා යන සමිඳු වදනට සාක්ෂි දරන ජනතාවක් වන්නට සැබෑ සිත් වෙනසක් ඇති කර ගත යුතුවේ.

චතාරිකය යනු ජීවිතයේ ඇතුළාන්තයට ම නැඹුරු වී සැබෑ ජීවිත වර්ධනයකට මඟ පහදා ගැනීමට ඉඩ සලසන වරප්‍රසාදීය සමයකි. ''නියමිත මොහොත පරිපූර්ණ වී තිබේ. දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්නය. පසුතැවිලිව සිත් හරවා ගන්න. සුභ අස්න  අදහා ගන්න.'' (මාක් 1:15)

''මනස්ථාපනය වීමට උවමනා නැතැයි සිතන සිල්වතුන් අනූ නව දෙනෙකුට වඩා මනස්ථාපනය වන එක පව්කාරයෙකු ගැන ස්වර්ගයේ ප්‍රීතිය ඇතිවන්නේ යයි ඔබට කියමි.'' (ලූක් 15:7)

ආදරයේ වටිනාකම තුළ තම ජීවිතය පූජා කළ ජේසු තුමන්ගේ නියම ආදරයේ රහස සැඟවී තිබෙන්නේ අනුන්ගේ ජීවිත සඳහා කැපවීමෙනි. මෙන්න මේ ආදරය තමයි පාස්කු අභිරහස තුල දුක් විඳ කුරුසිය මත මරණයට පත්වෙලා අපට දුන්නේ. ධනය, බලය, කීර්තිය ලබා ගැනිමට එකිනෙකා පසෙකට කර යන තරඟකාරි සමාජයක ජීවත්වන අපට දෙවිඳුන් අමතක වී ඇති සෙයින් ඇතුලාන්ත  ජීවිත වෙනසක් ලබා ගන්නට නම් සිත ඉරා ගෙන දෙවිඳුන්ගේ ආදරය අත්දැකිය යුතුයි.

ජුදාස්ලා සේ පාවාදීමට අපි කොයි තරම් උත්සහ දරනවාද? පිලාත් සේ ඕනෑම දෙයක් සිදුවන්නට ඉඩ හැර තම අත සෝදා ගෙන පසෙකට වී සිටිය අය කොතෙක්ද? අපහාසය, අවමානය, නින්දාවට අන් අයව පත් කරවමින් අතුල් පහර ගසමින් ගරහන අය එමටය. වෛරය, ඊර්ෂ්‍යාව, පලි ගැනීම, ක්‍රෝධය, මමත්වය නිසා සිත් තුල සුව නොවන තුවාලයක් ලෙස ජීවත් වෙමින් කුරුසයේ බර කරට ගත් ජීවිත ගමනේ දුෂ්කරතා අවබෝධ කරගත් සිරනේවුස්ලා, වෙරෝනිකාවන් අද නැතුවා නොවේ. ජීවිතයේ සැප බෙදා හදා ගෙන ළඟින් හිඳින වෙරෝනිකාවන් හදවතේ රුව තැන්පත් කරනු වෙනුවට ඔවුන්ගේ ජීවිත කඳුලින් පුරවන අයගෙන්ද අඩුවක් නැත.

චතාරිකය කී සැනින් කිතුනුවන්ගේ මතකයට නිරන්තරයෙන් නැගෙන්නේ පාදනමස්කාරය, එක්වරු ශීලය යන කරුණු දෙකයි. පශ්චත්තාපය, මර්දන ක්‍රියා, ගොඩමස් වැලකීම ඒ අතරම වේ. මේවා චතාරිකයට පමණක් සීමා කරමුද යන්න සිතිය යුතුය. චතාරිකයේ සාන්ත සභා මාතාව ක්‍රිස්තු දුක්ප්‍රාප්තිය මඟින් යොමු කරන්නේ සත්‍ය යේ යථාර්තය අන්ධකාරයෙන් ආලෝකය වෙතටය, පාවාදීමෙන් ගැලවීම පිණිසය. කිතුණු අප මේවා විශ්වාස ධර්මතාවයන්සේ පවතීද යන්න මෙනෙහි කිරිමට සුදුසුම කාලය ලෙස චතාරික සමය අපව මෙහෙයවයි. අපේ හදවත් දෙස එබී බැලීමටත් අතුල් පහර, කස පහර, මිටි පහර අප වෙත එල්ලවන තරමට අභියෝගයන් පිලිගැනිමට කිතු සමිඳෝ අපට ආරාධනා කරයි. කිතුනුවා සැම විට බැහැපත් වීමේ, ඉවසීමේ, සාමයෙන් විසිමෙන්, සමාදානයෙන් ජීවත්වීමේ අපූරු මනුෂ්‍යයෙකි. සැබෑ බැහැපත්කම හඳුනා ගත යුතු සමිඳුන්ට ප්‍රසන්න විය යුතු නම් පළමුව අපගේ ජීවිත තුල ඇති රළ පිඩැලි ඉවත් කල යුතුවේ. ක්‍රිස්තු විජයග්‍රහණය ජීවිත තුළට ඇදා ගැනිමෙන් අද සමාජයේ එතෙරවීම කුමක්දැයි හඳුනා ගෙන සැබෑ චතාරිකයක් අත්දකිමු.





# උන්වහන්සේ නැඟිට වදාළ සේක

දොමිනිකා පැවිදි පංතියේ

**ජයලත් බලගල්ල පියතුමා**

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නැවත නැගිටීම ආරම්භ වන්නේ අවුල් සහගත තත්ත්වයක් මැද යි. උන්වහන්සේගේ මරණයත් සමඟ උන්වහන්සේට ඉතාමත් සමීප ශ්‍රාවකයන් කරන්නේ පලායෑම යි, විසිරයාමයි. එකිනෙකා තම ජීවිතය ගැන බියෙන් සැඟව ගැනීමයි. එහෙත් පාස්කු මංගල්‍යය අවසන් වූ සැණින් හිමිදිරි පාන්දරම තම ස්වාමියාණන් සොයා යන්නේ කාන්තාවෝ යි. බියසුළු යැයි සම්මත කාන්තාවෝ යි.

කෙසේ වුවද ජේසුස් වහන්සේව තැන්පත් කර තිබූ සොහොන් ගෙය ළඟට ගිය විට කාන්තාවන්ගේ මුල්ම ප්‍රශ්නය වන්නේ, ඔවුන්ට ගල්ලෙනේ දොරටුව වසා ඇති ගල ඉවත් කර දෙන්නේ කවුරුන්ද යන්න යි. එහෙත් සැනෙකින් ඔවුන් දකින්නේ ගල්ලෙනේ ගල පෙරලා දමා ඇති සැටිත් ජේසුස් වහන්සේ ගේ සිරුර තවදුරටත් එහි නැති බවත් ය. එසේ නම් උන්වහන්සේගේ සිරුරට වූයේ කුමක්ද? එය ගෙන ගියේ කවුද? නැති නම් සඟවා ඇත්තේ කොතැනද? ඔවුන්ගේ සිත් මුළුමනින්ම අවුල් වියවුල් වී ගොස් ඇත.

මේ අතර ඔවුන් යමෙකු දැක උයන් ගොව්වා යැයි සිතා ජේසුස්වහන්සේ ගැන යමක් ඔහු දන්නේ යැයි සිතා ඒ ගැන විමසති. එහි ප්‍රතිඵලය ඒ තමන් සොයන තම ස්වාමියා වූ ජේසුස් වහන්සේ ගැන දැන ගැනීමයි. ප්‍රීතියෙන් කුල්මත් වූ ඔවුන් වහා දුව යන්නේ ශ්‍රාවකයන්ගෙන් පිරිසක් බියෙන් සැඟවී සිටින තැනටයි. පුවත, එනම් ජේසුස් වහන්සේගේ උත්ථානය මරණය පරදවා නැවත නැගී සිටින බව දැන ගැනීම ඔවුන්ගේ සිත් වියවුල් කිරීමට හේතුවේ. විශේෂයෙන් ම කාන්තාවන් පිරිසක් විසින් කියන මේ කථාව

**‘ සැබවින්ම උත්ථානය ගැන වූ මෙම වියවුලම උන්වහන්සේගේ මරණය පරදවා නැගී සිට ඇති බව ට කරන සංඥාවක් නොවේද? ’**

සත්‍යයක් යැයි පිළිගන්නේ කෙසේද? එදා කාන්තාවන් සැලකුවේ යමක් කමක් දැන ගැනීමට නොහැකි, සත්‍යවාදී යැයි ගණන් ගැනීමට නොහැකි, නීතිමය බලයක් නැති දෙවන ගණයේ පිරිසක් ලෙස පමණකි. එසේ නම් ඔවුන් කියන දේ පිළිගන්නේ කෙසේද? අවුල් වියවුල් සිතින් ජේසුස් වහන්සේ තැන්පත් කර තිබූ තැනට දිවයන පේදුරුතුමන් සහ ජුවාම් තුමන් දකිනේ ද හිස් වූ සොහොනකි. රෝල් කර තබා තිබූ සුදු රෙද්දකි. ජේසුස් වහන්සේගේ උත්ථානය ගැන හරි දැනුමක් කරා තවමත් නොඑළඹුනත් උන්වහන්සේගේ සිරුර එහි නැති බව නම් සත්‍යයකි.

සැබවින්ම උත්ථානය ගැන වූ මෙම වියවුලම උන්වහන්සේගේ මරණය පරදවා නැගී සිට ඇති බව ට කරන සංඥාවක් නොවේද? ඉගියක් නොවේද? අපට ජීවිතය කරා, ජීවිතයේ අවශ්‍යතාවය කරා සියළු වද වේදනා මත ජීවිතය රැක ගත යුතු යැයි, ජීවිතය වෙනුවෙන් සටන් කල යුතු යැයි යන අදහස අප වෙත ගෙන එන්නේ මරණයයි.

මුළු ලෝකය දෙසම බලන විට සැම තැනම අද දක්නට ඇත්තේ ජීවිතයට වඩා මරණයයි. කැපී පෙනෙන්නේ මරණයේ සේයාවයි. එහෙත් එම මරණයම අපට ජීවිතය සෙවීමට ලෝක නායකයන් ට සාමයේ ඇති වැදගත් කම කියා පෑමට අන් අයගේ ජීවිත ගැන හැඟීමක් වේදනාවක් ඇත්තන්ට ජීවිතය වෙනුවෙන් කැපවී සේවය කරන්නට ධෛර්යය දෙන්නේ අන් කිසිවක් නොව ඔවුන් ඉදිරියේ දක්නට ඇති මරණයයි. මේ ජීවිතය සහ මරණය අතරට පමණක් සීමාවූවක් නොවේ. වත්මන්හි ලොව පුරා වැඩිපුර සිටින්නේ ජීවත් වෙමින් මරණයට පත්වන්නන් ය. දිනපතා ඔවුන් අත්දකින්නේ කුසගින්න ය. රෝගී බවය. බලාපොරොත්තු කඩවීමය. බියය. එහෙත් මෙවන් විපත්ති හමුවේ එය සත්‍යය ලෙස පිළිගෙන නිහඬව සිටිය යුතුද ? නැත. සිදුවිය යුත්තේ බාධක මැද ජීවිතය සෙවීමයි. ජීවිතයේ අයිතිය සෙවීමයි. කිතුණු අප මරණය සලකන්නේ විනාශයක් හෝ අවසානයක් ලෙස නොවේ. ඒ වෙනුවට එක් අවස්ථාවකින් තවත් අවස්ථාවක් කරා එතෙර වීමක් කරා යාමක් හැටියටියි. එය සත්‍යයක් බව අපට වඩාත් වැටහෙන්නේ ද මරණය හමුවේම යි. අපට ජීවිතය ගැන සිතීමට ස්ථිර හේතුවක් අප හමුවේ ඇත. ඒ ජේසුස් වහන්සේගේ මරණය පරදවා නැවත ජීවිතයට උත්ථාන වීමයි. සදාකාලික අමරණීය ජීවිතයකට උත්ථාන වීමයි. අප අදහන්නේ මියගිය පුද්ගලයෙකු නොව ජීවනයේ පුද්ගලයෙකි. අපට වැදගත් වන්නේ ජීවිතයයි. මරණය නොවේ. එහෙත් මරණය එදා ජේසුස් වහන්සේ උත්ථාන වූ අවස්ථාවේ මෙන් අදත් ලොව පුරා ඇති අවුල් සහගත තත්ත්වය අපට ගෙන ආ යුත්තේ මරණයේ විනාශයේ බලාපොරොත්තු කඩවීමේ මාර්ගයේ නොව ජීවිතයේ බලාපොරොත්තුවේ මාර්ගයේ යි.

මන්ද අපට ඇත්තේ ජීවිතයේ ස්වාමියාණන් කෙනෙකු මිස, මරණයෙන් අවසන් වූ ස්වාමියාණන් කෙනෙකු නොවන බැවිනි.

# අන්තර් ගිවිසුම් යුගය හා පාස්කු නිමේෂය

ශාස්ත්‍රපති
හේමාල් පෙරේරා



අන්තර් ගිවිසුම් යුගය ලෙස සැලකෙන්නේ ජුදා ආගමික පසුබිමේ සිට ක්‍රිස්තු කේන්ද්‍රීය පරිසරයට සංක්‍රාන්ති වූ කාලයයි. පාස්කු මංගල්‍යය ජුදා ආගමික සන්දර්භයේ ද ක්‍රිස්තියානි ආගමික සන්දර්භයේ ද පවත්වන පිලිවෙතකි. ජුදා පාස්කුවේ දිගුවක් ලෙස වර්තමාන පාස්කුව පෙන්වා දිය හැකිය. පුරාණ ගිවිසුම ලේඛන ගත කිරීම අවසන් වුයේ, ක්‍රි.පු. පළමුවන ශත වර්ෂයේ පමණය. නව ගිවිසුම ලේඛනගත කිරිම අවසාන වුයේ ක්‍රි.ව. පළමු ශත වර්ෂයේ පමණ වේ. එම යුග දෙක අතර සංක්‍රාන්ති කාල පරිච්ජේදයකි. පාස්කු සම්බන්ධයෙන් එම යුගයේ සිදු වූ බොහෝ දේ කෙටියෙන් හෝ විස්තර කිරිම මෙම ලිපියේ අරමුණයි. මාගේ සටහන පහත සදහන් කරුණු ඔස්සේ පෙළ ගැසේ.

1. ජුදා පාස්කුව
2. ක්‍රිස්තුන් වහන්සේගේ පාද දෝවනය
3. ක්‍රිස්තුන් වහන්සේ කුරුසපත් කිරිම
4. එතුමන්ගේ පුනර්ජීවනය

## ජුදා පාස්කුව

ජුදාවරුන්ගේ ප්‍රධාන මංගල්‍යයන් 6කි. ඒ අතර ප්‍රධාන වන්නේ, පාස්කු මංගල්‍යයයි. අනෙකුත් මංගල්‍යයන් වන්නේ පෙන්තකොස්ත, කූඩාරම්,

> මුල් යුගයේ ක්‍රිස්තුස් වහන්සේගේ මරණය උත්ථානය සැමරුවත් කුමන දිනයක පැවැත්වුවේද යන්න පැහැදිලි සාක්ෂි නැත.

නුමුහුන් පුප, පාප පූජා, දේව මාලිගාව කැප කිරිම (හනුකා) යන ඒවා වේ. ඉහත මංගල්‍යයන් ඊශ්‍රායෙල්වරුන් මිසරයේ වහල් භාවයෙන් මිදීම, විමුක්තිය ලැබීම යන අර්ථයෙන් පවත්වන සැමරුම්ය. ජුදාවරුන් මිසරයේ ජිවිත ගතකල කාලය වසර 450කි. ඉන් වසර 30ක් පමණ කාලයක් වහල් ජිවිතයක් ගත කර ඇත. අනෙකුත් කාල පරාසය සමෘද්ධිමත්ව ජීවත් වි ඇත. ක්‍රි.පු. 1290 - 1280 අතර කාලයේදි ඊශ්‍රායෙල්වරු තම මිදීම අත්පත් කරගෙන ඇත. ඒ සඳහා ඔවුන් රතු මුහුද තරණය කර එතෙර විය. ඒ බව පැහැදිලි වන්නේ ජුදා දින දර්ශනයෙනි. එම නිසා ජුදා දින දර්ශනයේ මුල් මාසය වන නිසාන් මස 14 (මාර්තු මැද, අප්‍රේල් මැද) එම එතෙර වීම සිහිපත් කිරීමට පාස්කු මංගල්‍යය පැවැත්විය.

පාස්කුව සදහා ග්‍රීක් බසින් "පස්කා" සහ හෙබ්‍රෙව් බසින් "පෙසාන්" ලෙස වහර ඇත. ක්‍රි.ව. පළවන සියවස වන විට ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විදීම, මරණය හා උත්ථානය පාස්කුව ලෙස නම් කරන්නට යෙදුණි. එහෙත් පාස්කු දිනය සම්බන්ධයෙන් ප්‍රාණයක් මතු වුයේ ජුදා දින දර්ශනය හා ග්‍රෙගෝරියානු දින දර්ශනය සංසන්දනය කිරිමෙනි. ජුදා වරුන්ගේ නමස්කාර දිනය වුයේ, සිකුරාදා හවස 6 සිට සෙනසුරාදා හවස 6 දක්වාය. එය සබත් දිනය ලෙස හැඳින්වූහ. එහෙත් ග්‍රෙගෝරියානු දින දර්ශනයේ ඉරුදින ආගමික දිනයක් ලෙස නම් කළේය. ඒ හේතුවෙන් පාස්කු මංගල්‍යය පවත්වන දිනය සම්බන්දයෙන් ගැටළු මතු විය.

මුල් යුගයේ ක්‍රිස්තුස් වහන්සේගේ මරණය උත්ථානය සැමරුවත්, කුමන දිනයක පැවැත්වුවේද යන්න පැහැදිලි සාක්ෂි නැත.

එහෙත්, ක්‍රි.ව. 2 වන සියවස පමණ වන විට එම දිනය නම් කිරිම අරගලයක් බවට පත් විය. එවකට රෝමයේ සභා පරිපාලනය ඇතිසෙටස් පාප්තුමා හට හිමි විය (ක්‍රි.ව.155-166). එතුමාගේත් සභාවේ ධර්මධරයන් වූ පොලිකාප් සහ වික්ටර් යන රදගුරුවරුන් පාස්කු සැමරුම් දිනය නිසාන් මස 14 වන දා පවත්වන ලෙස ඉල්ලා සිටින ලදී. පාප් තුමා එයට විරුද්ධ විය.

එම ප්‍රශ්නය නිරාකරණය කරන ලද්දේ ක්‍රි.ව. 325 දී පවත්වනු ලැබූ නිසියාන මන්ත්‍රණ සභාවේදීය. ඒ අනුව පාස්කු මංගල්‍යය නිසාන්, මස 14වන දින පසුවී පැමිණෙන 15 වන දිනයට පසුව එන පළමු ඉරිදා පාස්කු මංගල්‍යය පැවැත්විය යුතු යැයි තීරණය විය.

## ක්‍රිස්තුස් වහන්සේගේ පාද දෝවනය

පාද දෝවනය ලතින් බසින් වහරන්නේ, "පෙඩිලාවියුම්" යනුවෙනි. ජුදයාවේ

8 වන පිටුවට >>>

<<< 7 වන පිටුවෙන්


භූගෝලීය පසුබිම කාන්තාර, දූවිලි අධික පරිසරයකි. ජුදාවරුන් නිවසින් පිටවී ගොස් නැවත නිවසට පැමිණෙන විට හෝ තම නිවසට අමුත්තන් පැමිණි විට නිවැසි වහල් සේවකයා එම පැමිණි අයගේ දෙපා දෝවනය කිරිම සිරිතකි. එයට හේතුව පිටස්තර පරිසරයේ අපිරිසිදු දේ හෝ විශබීජ පාද වල තැවරි නිවස තුළට පිවිසෙන බැවිනි. දෙපා දෙවීම කරන ලද්දේ වහලා විසිනි.

ක්‍රිස්තුස් වහන්සේද පාද දෝවනයේදී කළේ වහල් සේවකයාගේ රාජකාරියයි. එහෙත් එතුමා දරන ලද්දේ දේව මනුෂ්‍ය ස්වභාවයයි. මන්ද උන් වහන්සේ දේව සමානකම ත්‍යාජ කරමින් වහලකුගේ ස්වරූපය ගෙන අප හා සමාන මිනිසෙකු වූ සේක. ඉන් පෙන්වා දෙන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ බැහැපත්කමයි. ඉහත සමානකම යන වචනය සඳහා ග්‍රීක බසින් "ඊසා" යන පදයද වහලා යන්න "ඩූලෝස්"යන වදනද භාවිතා කරයි. වහලාව හසුරවන්නේ ස්වාමියාය. ක්‍රිස්තුන් වහන්සේව හසුරවන්නේද ස්වාමියා ය. එනම් දෙවියන් වහන්සේ ය.

මහ බ්‍රහස්පතින්දා දිනයේ පාද දෝවනයේ නමස්කාර ක්‍රමය ටොලේඩෝ සිනඩ් සභාව ක්‍රි.ව. 694 දී අනුමත කර ඇත. එසේම 13 වන සියවසේදි රෝමයේ බැබිලන් නියෝගය මගින් නැවතත් එය අනුමත කරන ලදී. ඒ අනුව, පාද දෝවනය සුවිශේෂී නමස්කාර ක්‍රමයක් බවට පත් විය. මුලින්ම පාද දෝවනය කරන ලද්දේ රදගුරු දේවස්ථානයේ පමණි. ඒ සඳහා අපෝස්තුරුවරුන් ලෙස 12 දෙනෙකු ආදේශ කර ගන්නා ලදී. පසුකාලයේදී 12 වන පයස් (ක්‍රි.ව.1823 - 1829) ශුද්ධෝත්තම පියතුමා විසින් සෑම දේවස්ථානයකම මහ බ්‍රහස්පතිනදා මෙහෙය සවස පැවැත්වීමටත් එම දිනයේ දී පාද දෝවනය කිරීමටත් උපදෙස් දෙන ලදී. පාද සේදිමේ පිළිවෙත පැවැත්වීමට පෙර ජොහාන් සුභාරංචියේ 13 වන පරිච්ඡේදය උච්චාරණය කල යුතු බවට ද නියෝග නිකුත් විය. වර්තමානයේ එම මෙහෙය කතෝලික සභාව පමණක් නොව සාම්ප්‍රදායික සභාවන් සහ ඇතැම් ධර්දානීය සභාවන් ද දේව නමස්කාර පොතට ඇතුළත් කර ඇත.

## කුරුස පත් කිරීම

දැවයෙන් තනන ලද කුරුසියක අපරාධකරුවන් එල්ලා මරණයට පත් කිරීම පුරාණ මැදපෙරදිග ශිෂ්ටාචාරයේ සිරිතකි. හෙරඩෝටස් නැමති ඉතිහාසඥයාගේ වාර්ථා වලට අනුව පර්සියානු අධිරාජ්‍යයකු වූ ඩේරියස් (ක්‍රි.පූ. 512 - 484) බැබිලෝනීය වැසියන් දහස් ගණනින් කුරුසියේ ඇණ ගසා මරා දමා ඇත. රෝමානු අධිරාජ්‍ය සමයේ වහලුන් අපරාධකරුවන් හට එම දඬුවම ලබා දුන්නේ යැයි ප්ලූටෝ පෙන්වා දේ. ඒ අනුව කුරුසපත් කල පළමු වැන්නා හෝ අවසානයා ක්‍රිස්තුස් වහන්සේ පමණක්



නොවන බව පැහැදිලිය. කුරුසියේ ඇණ ගසා මරා දැමීම නතර කරන ලද්දේ ක්‍රි.ව. 313 රෝම අධිරාජ්‍යයා වූ කොන්ස්තන්තීනු විසිනි. රෝම පරිපාලනයට අනුව, අපරාධකරුවන් කුරුසියේ ඇණ තැබීමට පෙර කස පහර දී ශරිරය අඩපණ කරයි. ශරීරයේ අන්තර්ගත රුධිරය, ජලය, ශරීරයෙන් ඉවතට ගලායන ප්‍රමාණයට පුද්ගලයා අඩපණ වේ. ඉන්පසුව කුරුසියේ ඇණ තබයි. ඇණ තැබූ පසුව අපරාධකරුව තිත්ත කාඩිය (මත්පැන් වැනි පානයක්) බීමට සලස්වයි. ඉන් සිදුවන්නේ සිහිමුර්ජා වීමයි. අපරාධකරුවා මරණයට පත්වන අවස්ථාව වන විට ඔහු සිහිමුර්ජා ගතියෙන් පසුවේ. පුද්ගලයා සාතනය කර දැමීමට හේතුව ලියන ලද පුවරුවක් ඒ කුරුසියේ එල්ලා තැබිය යුතුය. මිය ගිය පසුව දේහය කුරුසියෙන් ඉවත් කරන්නේ නැත. ශරිරය නරක් වී අවසානයේ කුරුසියෙන් ගැලවී බිම වැටේ. එවිට සතුන් එම දේහය ආහාරයට ගනී.

## ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසපත් විම

උන්වහන්සේගේ කුරුසපත් විම සම්බන්ධව සුභාරංචි හතරේම සටහන්ව් ඇත. ඒ අනුව ඉහත පෙන්වා දුන් පරිදි ක්‍රිස්තුස් වහන්සේට ද කස පහර දී ඇත. වද දණ්ඩට බඳින හරස් ලි කඳ ඔසවාගෙන යාමට එතුමන්ට සිදු විය. ඇණ ගසන ලද්දේ ජෙරුසලමට උතුරින් පිහිටි ගොල්ගොතාව ගම්මානයේ පිහිටි කඳුකරයේ ය.

සුභාරංචි පෙන්වා දෙන පරිදි උන්වහන්සේ කුරුසපත් වී ඇත්තේ, මධ්‍යහාන ජාමය පසු වීය. මධ්‍යහාන ජාමය යනු, දහවල් 12 පසුවී පැය 3 ක් පමණ ගත විය. උන්වහන්සේ උකුත්වූයේ, එම වේලාවේදීය. එය සිකුරාදා දිනයකි. සබත් දිනය ආරම්භ වන්නේ සිකුරාදා හවස 6 ට ය. ක්‍රිස්තුස් වහන්සේ මියගියේ සිකුරාදා හවස 5 ට ය. සබත් දිනයේ දේහයක් භූමදාන නොකෙරේ. එම නිසා ක්‍රිස්තුස් වහන්සේව ළඟිලගියේ භූමදාන කිරිමට සිදු විය. එම නිසා තාවකාලික මිහිදන් කිරිමක් එතුමාට ලැබුණි. සබත් දිනයට පසුවදා සතියේ පළමුවනදාය. මරිය මද්දලේනා ගල්ලෙන වෙත පැමිණියාය. සතියේ පළමුවනදා ය. එවිට දුටු දර්ශනය වූයේ, ගල්ලෙන ආවරණය කල ගල ඉවතට පෙරලා තිබිමයි.

මතෙව් තුමාගේ අනාවරණයට අනුව ක්‍රිස්තුස් වහන්සේ ජුදාවරු බලාපොරොත්තු වූ මෙසියස් තුමාය. මෙසියස් තුමා පැමිණෙන්නේ ජනතාව වහල්භාවයෙන්, පාපයෙන් මුදවා ගැනීමට ය. එතුමා පැමිණ මෙසියානු මෙහෙය සම්පූර්ණ කර භූමදාන කරනු ලැබූ බව උන් වහන්සේ ද පවසා ඇත.

උදා: බෙතානියේ ආලේපය පෙන්වා දිය හැක. උන්වහන්සේගේ මෙසියානු කාර්යය අවසාන වන්නේ ජෙරුසලමට නුදුරු ගෙත්සෙමෙනිය නම් ඔලිව් ගස් වැවී තිබූ පලතුරු වත්තේදිය. එහිදි ක්‍රිස්තුස් වහන්සේ තම පියාගෙන් ඉල්ලන්නේ "මාගේ පියාණනි, හැකිනම් මේ කුසලාන මාගෙන් පහ කල මැනව" කියා ය. එහෙත් "මාගේ කැමැත්ත නොව, ඔබගේ කැමැත්ත වේවා"යනුවෙනි (මතෙව් 26:39).

ඉන් ආරම්භ වන මහ බ්‍රහස්පතින්දා දිනයෙන් පාස්කු මෙහෙය අවසාන වන්නේ, උන්වහන්සේගේ උත්ථානයෙනි. එම නිසා මහ බ්‍රහස්පතින්දා සිට පාස්කු ඉරුදින දක්වා වෙන් කල නොහැකි එකම ආකාරයකට අඛණ්ඩව ගමන් කරනු දේව වන්දනාවකි. එය කොටස් වශයෙන් වෙන් කල නොහැක.



# ස්වාමින් වහන්සේගේ කුරුසියේ මරණය හා පුනරුප්ජීවනය

කේ. ජේ. හෙන්රි පෙරේරා
මීගමුව.

කුමන හෝ ධර්මයන් අදහන ලෝ වැසි බොහෝ දෙනකුගේ අභියෝගයට හේතු වූ කරුණකි ස්වාමීන් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූවාද යන්න. ඒ එවැන්නක් කිසි කලෙක මෙලොව තුළ සිදුවී නොමැති නිසාය.

මෙම කරුණු පිළිබඳ පමණක් නොව අභියෝගාත්මක සිද්ධි කිහිපයක් දහම හා බැඳී ඇත. ස්වාමීන් වහන්සේ එදා පැවසූ ලෙස උන්වහන්සේ දිව්‍ය සත්ප්‍රසාදය තුළ වැඩ සිටීමද එවන් වූවකි.

සිද්ධිය විශ්වාසය තුළ තහවුරු කරන්නක් වුවද, උන්වහන්සේගේ උත්ථානය උන්වහන්සේට මෙම මරණය සිදු කළෝද, උන්වහන්සේ කුරුස ගතවීම හා උත්ථානවීම දැසින්දුටුවෝද, උන්වහන්සේ ජීවත්ව සිටියදී, උන්වහන්සේ කී වදන් ඇසුවෝද, උන්වහන්සේ කළ ප්‍රාතිහාර්යය පල ලැබූවෝ හා ඒවා දර්ශනය කළෝද,මීට සාක්ෂි දරන්නෝය.

උන්වහන්සේ උත්ථාන වන්නේ නම් ඒ වැළැක්වීම සඳහා, ආරක්ෂක ස්ථානයක උන්වහන්සේ තැන්පත් කෙරුවෝද, එම ස්ථානය ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂකයින් ස්ථානගත කෙරුවෝද, සත්‍යය වසන් කිරීමට බොරු සාක්ෂිකරුවන් යෙදෙව්වෝද,කළේ මෙහි සත්‍යතාව වසන් කිරීම සඳහා උපායන්ය.

හෙරොද් වරුන්ට හා නායක පූජකයින්ට අවශ්‍ය වූයේ තම තමන් ගෙන යන වැරදි මානුසික හා ආගමික ක්‍රියාකාරකම් විවේචනය කළවුන්, අතුගා දැමීම හා වනසා දැමීමය. ස්නාවක ජුවාම් තුමා මෙන්, "මේ මාගේ පුත්‍රයා" යයි දෙවියන් වහන්සේ වදාළ ක්‍රිස්තුන් වහන්සේද, සමග සත්‍යධර්මය ඉදිරියට ගෙන යාමට සූදානම් වූවන් මරා දැමුවාට පසු, උන්වහන්සේගේ ශ්‍රාවක පිරිස් ද ඉතා කෲර ලෙස වරින් වර මරා දැමූහ. ස්වාමීන් වහන්සේ තම මව රක්ෂා කිරීමට භාර දුන් ඥාති සහෝදර ජොහාන් තුමා හැරුණුකොට අන් සියලුම ශ්‍රාවකයන් ඔවුන් මරා දැමූ අතර ජොහාන්තුමා රක්ෂා වූයේ දේවානුභාවයෙන් මෙනි.

ඉදිරියේ සිදුවන්න දුටු ස්වාමීන් වහන්සේ තමන් කළ ප්‍රාතිහාර්යමක සිද්ධීන් හා, තමන් වහන්සේගේ පුනරුප්ජීවනය කිසිවෙකුට නො පවසන ලෙස අවස්ථා කිහිපයක උපදෙස් දුන්නේද ,තමා පැමිණි දේව කාර්යය ඉටු කිරීමට වග බලා ගනිමිනි.

ස්වාමීන් වහන්සේගේ උත්ථානය පිළිබඳව ශුද්ධවූ බයිබලයේ ශුද්ධවූ මාක් තුමා සඳහන් කරන්නේ කුමක්දැයි විමසා බලමු.

ස්වාමීන් වහන්සේගේ මෙලොව ජීවිතයේ අග සතියේ සිද්ධීන් හා විශේෂයෙන් කුරුසියේ මරණය, හා පුනරුප්ජීවනය ගැනඅනෙක් සුවිශේෂක තුමන්ලාට වඩා සවිස්තරයක් ශුද්ධ වූ මාක් තුමා ඉදිරිපත් කරයි.

ශුද්ධ වූ මාක් තුමා අනෙකුත් සුවිශේෂකතුමන්ලාට සමකාලීන ජුදා ජාතිකයෙක්වූ අතර, එතුමා ක්‍රිස්තු ශ්‍රාවකයෙකුවූයේ පේදුරුතුමාගේ අනුග්‍රහයෙනි. පැරණි ලිපි ලේඛන වලට අනුව මාක් තුමා මේ රචනා කර ඇත්තේ ස්වාමීන් වහන්සේගේ මරණයෙන් වසර තිස් දෙකකට පමණ පසුව ය.

ශුද්ධවූ පේදුරුතුමා හා සාකච්ඡා කරමින්, තමන් ඇසූ දුටුදේද සමග එතුමා සුභ අස්න එළිදැක්වීය. පේදුරුතුමාගේ නායකත්වයෙන් පිහිටවූ කතෝලික සභාවේ බිෂොප්වරයෙකුද වූ එතුමා ක්‍රිස්තු තුමන්ගේ දහම වෙනුවෙන් ප්‍රාණ පරිත්‍යාගී වූයේය.

ස්වාමීන් වහන්සේ මරණගත වූ බව මාර්ක් තුමා පවසන්නේ "පිළාත්ද උන්වහන්සේ ඒ තරම් ඉක්මනින් අපවත් වූ බව අසා පුදුම වී ශතාධිපතියා කැඳවා උන්වහන්සේ මේ ඉක්මනින් මළ සේක්දැ"යි ඇසීය, (ශු.මාක් 15:44)

මග්දලාවේ මරියා ඇතුළු පිරිස ක් ආලේප සුවඳ රැගෙන ස්වාමීන් වහන්සේ ආලේප කිරීමට ගිය අවස්ථාවේ සොහොන් දොර ගල ඉවතට පෙරළා තිබෙනු දැක භීතවූ අවස්ථාවේ සුදු සළුවක් ඇඳගත් තරුණයෙකු දකුණු පසේ පෙනී සිටිමින් ''බිය නොවන්න සොයන්නේ කුරුසේ ඇණ ගසනු ලැබූ නාසරෙත්හි ජේසුන් වහන්සේය උන්වහන්සේ උත්ථාන වූ සේක උන්වහන්සේ මෙහි නැත.

10 වන පිටුවට >>>

<<< 9 වන පිටුවෙන්

මේ බලන්න ඔවුන් උන්වහන්සේ තැන්පතකළ ස්ථානය" (ශු.මාක් 16:6) යනුවෙන් දැනුම් දුන්නේය.

"සතියේ පළමු වන දා අලුයම ජේසුන් වහන්සේ නැගිට වදාළ කල උන්වහන්සේ තමන් විසින් යක්ෂයන් සත්දෙනකු දුරු කරනු ලැබූ මග්දලායේ මරියාට මුලින්ම දර්ශනය වූ සේක. ඈ ගොස් අඬමින් වැළපෙමින් සිටි උන්වහන්සේගේ හිතවතුන්ට එපවත් සැළ කළාය . එහෙත් උන්වහන්සේ ජීවමානව සිටින බවද ඇයට දර්ශනය වූ බවද ඇසූ විට ඔහු එය විශ්වාස නොකළහ. (ශු. මාක් 16:9-11) ''ඉක්බිති ඔවුන්ගෙන් දෙදෙනකු පිටිසරට යන කල උන්වහන්සේ අන් විලසකින් ඔවුන්ට දර්ශනය වූ සේක .ඒ දෙදෙන ආපසු ගොස් අනෙක් අයට එපවත් දැන් වූහ. ඔහු ඔවුන් කී දේ වුවද විශ්වාස නොකළහ ''(ශු.මාක් 15:12-13) ඒ උන්වහන්සේ ශ්‍රාවකයන් දෙදෙනෙකුට දර්ශනය වූ කලය.

එදාද අද මෙන්ම මේ පිළිගැනීමට තරම් ඇසුවන්ට අපහසුවූ කරුණක් වූයේ පෙරද සඳහන් කළ පරිදි , මෙවැන්නක් මෙලොව කවදා හෝ ඇතිවී නොමැති නිසාය. කෙසේ හෝ හෙරෝද්ගේ හේවා පිරිස් හා නායක පූජකයෝද රැස්ව සිටි පිරිසද ඇස් පනාපිට මේ මරණ අවස්ථා දුටහ.

"මාගේ දෙවියනි මාගේ දෙවියනි ඔබ මා අත් හැරියේ මක් නිසාද'' කියා උන්වහන්සේ තමන්ගේ දෙවි බවේ අයිතියද ප්‍රකාශ කළ සේක.

දේව මාලිගේ තිරය ඉරී ගොස් සිදුවූ අස්වාභාවික සිද්ධීන් ඔස්සේ සැබවින්ම මේ මනුස්සයා දෙවියන් වහන්සේගේ පුත්‍රයානෝමයයි උන්වහන්සේ අභිමුවෙහි සිටි සතාධිපතියා හා මේ දුරින් බලා සිටි සැවොමද කීහ.

ස්වාමීන් වහන්සේගේ උත්ථානයෙන් පසු උන්වහන්සේ දුටු බව එදත් අවිශ්වාස කළ නිසා ඔවුන්ගේ සිත් දුර්වලතාවයට උන්වහන්සේ දොස් පැවරුවේය. උන්වහන්සේ ඔවුන් අමතා ඔවුන්ට විශේෂ වරප්‍රසාදයන් ප්‍රදානය කොට ''ලොව පුරා ගොස් සකල සත්වයාට සුභ අස්න දේශනා කරන්න ,අදහා භෞතිස්ම ස්නානය ලබන තැනැත්තේ ගැලවීම ලබන්නේය. එහෙත් නො අදහන තැනැත්තේ වරදකරු යැයි තීන්දු ලබන්නේ යැ"යි (ශු. මාක් 16:15-16) ප්‍රකාශ කළ සේක.

''මා සිහි කරන පිණිස මේ සිදු කරන්න'' යයි ප්‍රකාශ කරමින් තම ශ්‍රාවකයන් වෙත උන්වහන්සේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩමැවූවා සේමද, එවැනි සඳහනක් වශයෙන් හැඳින්වීමට සමහර හිස් විශාරදයන් උත්සාහ ගනී නම් ඒ කොතරම් ඛේදවාචකයක්ද? මෙතරම් ඇස දුටු සඳහන් අනුව සත්‍යය ප්‍රකාශ වෙද්දී ඊට එරෙහි වන්නේ නම් ඒ අසත්‍ය රජ කිරීමේ අද වන් වූ කූඨෝපායකි.



# මරියතුමී සමඟින් කුරුසිය පාමුලට යමු

හලාවත පදවි මරිය හමුදා සේවක
**යු. එල්. ශ්‍රියානි පෙරේරා සොහොයුරිය**

2025 මේ වසරේ චතාරික සමය අපට ඉතාමත් සුවිශේෂී කාලයක් වන්නේ, අප සමිඳාණන් වහන්සේගේ ජුබිලි වසරේදි අපට ලැබෙන ප්‍රසාද ජනක කාල පරිච්ඡේදයක් වන බැවිනි. මෙම වරප්‍රසාද කාලය අපතේ නොහැර නව ජෙරුසලම නැමති ස්වර්ගීය නිවහනට ඇතුල්වීමට යන වන්දනා ගමනේ පෙර සුදානම් වන කාලයක් කරගනිමු.

මේ කාලය තුළ මවක්, පියෙක්, පුතෙක්, දුවෙක් ලෙස අප සැමගේ පාපයන් වෙනුවෙන් වන්දි ගෙවන සමිඳාණන් වහන්සේගේ මහා දුක් ප්‍රාප්තිය මෙනෙහි කරමු. අනේක වදගාවිනා විධ, නීච පවුකරුවෙකු ලෙස හංවඩු ගසමින් මිනිස් සිරුරට දරාගත නොහැකි දරුණු වදවේදනාවල මානසික, ශාරීරික දුක්ගාවිනා මැද ජුදයන්ගේ සමච්චල් වදන්, කෙළ පහරවල්, නින්දා සහගත ක්‍රියා මැද අසරණ වු ජේසුතුමාගේ ශ්‍රී ශරීරය මෙනෙහි කරමු.

ජේසුතුමන් බර වු කුරුසියක් කර තබාගෙන වැටි වැටී කස පහරවල් විඳිමින් කපාල කඳු මුදුනට යන දුක්බර ගමනේ සිය මෑණියන්ගේ හදේ මොන තරම් වේදනාවක් ඇති වී ඇත්ද යන්න මෙනෙහි කරමු.

කිසියම් පාපයක් නොකළ තම පුතාගේ ගතේ සිතේ තුවාල කොපමණද?

මේ සෑම දෙයක්ම දරාගත්තේ දේව කැමැත්ත පිළිගැනිම, දේව අණට කීකරුවිම, අවනත විමත් මතයි.

දෙවි පුත් කුමරුන් ලෙසම දේව අම්මත් ලෝක ගැලවිමේ කාර්යයට තම සිත, කය දෙකම පිය වදනට අවනත වුයේ ජේසු සමිඳාණන් මාංශ ගත වු මොහොතේ සිටයි. දේව කැමැත්ත අභියස සිය කැමැත්තෙන් හිස් වු භාග්‍යවත් දේව අම්මා මිනිස් මුවකින් කීමට බැරි තරම් කටුක වේදනා දරාගත්තේ ශුද්ධාත්ම අනුහසින් පිරීමෙනි. ශුද්ධාත්ම වදනින් තම කුස තුළ මාංශ ගත වු ජේසු කුමරුන්ගේ ශ්‍රී ශරිරයේ සෑම ලේ බිඳක් තුළම ඇත්තේ මරියතුමියගේ රුධිරයයි. එබැවින් ජේසුගේ රුධිරය දේව අම්මගේම රුධිරයයි. දිව්‍ය ප්‍රසාදය තුළද ජීවමාන ජේසුතුමන්ගේ ප්‍රථම දිව්‍ය සත්ප්‍රසාද නිවහන වන්නේමරිය තුමියගේ කුසයයි. මිනිස් සංහතියේ මෑණියන් ලෙස එදා කුරුස ගසේදි අප හට තිළිණ කළ දේව අම්මා අපගේම මෑණියන් ලෙස පිළිගෙන අපගේ දුක් වේදනා හමුවේ අප වෙනුවෙන් මැදිහත් වන ලෙස අයදිමු. භාග්‍යවත් අම්මාගේ රැකවරණය මුළු මිනිස් සංහතියේ ගැලවීම වෙනුවෙන් යදිමින් කුරුස පාමුලට අපි යමු.

# දේශනා නවයේ පසම් ගායනය

**ක්‍රිස්ටෝපර් විජේරත්න**
විශ්‍රාමික විදුහල්පති, වහකෝට්ටේ

පාස්කු මංගල්‍යය සිහිකිරීමේ දි ක්‍රිස්තුන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය මුල් තැනක් ගනියි. උන්වහන්සේගේ දුක් විඳීම හා මරණය සිහි කිරීම මෙහිදි විශේෂාකාරයෙන් සිදුවේ. ක්‍රිස්තුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය සිහි කිරීමේ දි පසම් ගායනය අමතක කල නොහැක. ක්‍රි.ව.1687 ගෞරවණීය ජුසේවාස් පූජාප්‍රසාදීන් වහන්සේ ලක් බිමට වැඩම කලායින් පසු එතුමාට සහය වීමට ක්‍රි.ව. 1697 දී සහ ක්‍රි.ව.1705 දී ගෝවේ ඔරතෝනියානු නිකායේ පූජාප්‍රසාදීන් වහන්සේලා 6 නමක් ලක් බිමට පැමිණි බව ඉතිහාසයේ සඳහන් වේ. ඉන් එක් පූජාප්‍රසාදීන් වහන්සේ නමක් වන්නේ ගෞරවණීය ජාකෝමේ ගොන්සාල්වෙස් පූජාප්‍රසාදීන් වහන්සේය.

සිංහල කාතෝලික සාහිත්‍යයේ පියා ලෙස හඳුන්වන ගෞරවණීය ජාකෝමේ ගොන්සාල්වෙස් පූජාප්‍රසාදීන් වහන්සේ එවකට කන්ද උඩරට සිටි උගත් භික්ෂුන් වහන්සේලා ගෙන් සහ ගිහි පඬිවරුන්ගෙන් සිංහල ඉගෙන ගෙන කතෝලිකයන් සඳහා සිංහල බසින් විවිධ යාච්ඤා සහ භක්ති අභ්‍යාස පොත් ලියා ඇති බව ඉතිහාසයේ සඳහන් වේ. මේවා අතුරෙන් දේශනා නවයේ පසම් පොත හා දුක්ප්‍රාප්ති ප්‍රසංගය විශේෂ තැනක් ගනී.

මෙම නිබන්ධන දෙකම එකම තේමාවක් යටතේ ලියා ඇති අතර පසම් පොත ගායනා කිරීම සඳහාත් දුක්ප්‍රාප්ති ප්‍රසංගය උච්චාරණය සඳහාත් නිර්මාණය කර ඇත. මෙම කෘතින් දෙකෙහිම අඩංගු වී ඇත්තේ "අපගේ දේව ගැලවුම්කාර විඳපු දුක් ගාවිනාවල්" ය.


පසම් පිළිබඳ පොදු ලක්ෂණ වන්නේ,


- චතාරික සමයේ ගායනා කිරීම.
- පවුලේ සාමාජිකයන් හෝ කුඩා කණ්ඩායම් එක් වී රාත්‍රි කාලයේ ගායනා කිරීම.
- පරම්පරාවට එන තීන්තෙන් ලියා අත් පිටපත් හෝ මුද්‍රිත පොත් භාවිතා කිරීම හා කණ්ඩායමේ කිහිපදෙනෙක් මාරුවෙන් මාරුවට ගායනා කිරීම.
- මෙම ගී බොහෝ විට අති විලම්බ ලයෙන් ගායනා කරයි. තාල රහිතයි, සංගීත භාණ්ඩ භාවිතා නොකරයි.

ආරම්භයේ සිට අද දක්වා වහකෝට්ටේ ග්‍රාමයේ සිදු කරයි මෙම පසම් ගායනයට පැරණි ඉතිහාසයක් ඇති අතර එය අපේ උරුමයක් ලෙස සලකනු ලබයි.



# පශ්චත්තාපය.





දෙවිඳුනි ඔබේ දයා කරුණාවෙන් මට අනුකම්පා කළ මැනව. ඔබේ විපුල දයාවෙන් මාගේ අපරාධ මකා දැමුව මැනව. (ගීතාවලිය 51 : 1 )

පශ්චත්තාපය පිළිබඳ විවිධ අර්ථකථන ඇත. ශු. බයිබලීය අර්ථකථන වලට අනුව පාපයෙන් හැරී ඒම පමණක් නොව, මුළු හෘදයෙන් ද මුළු සිතින් ද වෙනස් වී සමිඳුන් වෙත හැරී ඒමයි.

''නුඹේ මුළු හෘදයෙන් ද මුළු ආත්මයෙන් ද නුඹේ මුළු වීර්යයෙන් ද නුඹේ මුළු බුද්ධියෙන් ද නුඹේ දෙවි වූ සමිඳාණන් වහන්සේටත්, නුඹ නුඹට ප්‍රේම කරන්නාක් මෙන් නුඹේ අසල්වැසියාටත් ප්‍රේම කරන්න". (ලූක් 10:27 )

පශ්චත්තාපය යනුවෙන් අදහස් කරනුයේ ක්‍රියාවෙන් වෙනස් වූ සිතක මනස්ථාපනයයි. ක්‍රියාවෙන් වෙනස් නොවුනු මනස්ථාපනය අර්ථ විරහිතය. මෙවැනි වූ මනස්ථාපනයක් නිසා අත්දකින දේව වරප්‍රසාද බහුල බව ද මේ චතාරික සමයේ අපට පසක් කර දෙයි.

තම ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කළ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ප්‍රථමයෙන්ම දේශනා කළේ මනස්ථාපනය වන ලෙසයි. ''පසුතැවී සිත්හරවා ගන්න, ස්වර්ග රාජ්‍යය ආසන්නය." (ශු .මතෙව් 4 : 17)

ජේසුස් වහන්සේගේ පෙර මග සරසන්නා වූ ස්නාවක ජොහාන් තුමා, තම දූත කාර්යය ඇරඹුවේ ද ජනතාව මනස්ථාපනයට කැඳවමිනි. ''පසුතැවී සිත් හරවා ගන්න, මන්ද ස්වර්ග රාජ්‍යය ළඟය." (මතෙව් 3 : 2 )

ශුද්ධ බයිබලය පැරණි ගිවිසුම පුරාවට ද මනස්ථාපනයේ අවශ්‍යතාවය හා එහි වැදගත්කම පැහැදිලි කරයි. අළු බදාදා දින අප මෙනෙහි කරන්නා වූ පළමුවන දේව ප්‍රකාශනයේ සඳහන් වන පරිදි ජෝවෙල් දිවැසිවරයා ඊශ්‍රායෙල් ජනතාවට ආරාධනා කරනුයේ, පසුතැවී සිත් හරවා ගැනීමට යි. සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක.'' උපවාසයෙන් ද වැලපීමෙන් ද මුළු සිතින් දැන්වත් මා වෙත හැරී එන්න. වත ඉරාගෙන නොව සිත ඉරාගෙන නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න. මන්ද, එතුමාණෝ, කරුණාබරිත, දයාන්විත, වහා නොකිපෙන තිර පෙමින් සමන්විත, කමා වීමට කැමති දෙවි කෙනෙකි". (ජෝවෙල් 2 : 12 - 13 )

එසේ නම් සැබෑ පශ්චත්තාපය, සැබෑ සිත් හැරීම, කිතුණු අපගේ ජීවිත වල වැදගත් අංගයක් විය යුතුය. ඒ සඳහා කළ යුතු වැදගත්ම දෙය වන්නේ අපගේ බැරි භාවය, දුර්වලකම සහ නොහැකියාව අවංක සිතින් පිළිගැනීම හා එයට මනස්ථාපනය වීමයි.

හමුවිය හැකි බැවින් සමිඳුන් සොයා යන්න, ළඟ ම සිටිය දී එතුමන් අයදින්න. දුෂ්ටයා සිය මාර්ගයෙන් හැරී, අදමිටු මිනිසා තම සිතුවිලි දුරලා, සමිඳුන් වෙත ඇදී ඒවා, එතුමන් ඔහුට අනුකම්පා කරනු ඇත. දෙවිඳුන් වෙත ඔහු හැරී ඒවා, එතුමන් ඔහුට බොහෝ සේ කමා කරනු ඇත. (යෙසායා 55 : 6 - 7)

**ගරු. සුමිත් සමීර ප්‍රනාන්දු**
සහෝදරතුමා.
**සාන්ත ජුසේවාස් දේව ධර්ම නිකේතනය**
කොළඹ - 08



# ලසෝ ගීතිකාවක ප්‍රතිරාවය

කිතු දහම සංගීතය හා සමීප සබැඳියාවකින් වෙළී පවතින ධර්මයකි. පුජනීයත්වයෙන් යුතු වුවකි. සජ්ජායනාවකී. සුදතුම් සිසිල ගෙන දෙන්නකි. දෙව් මැදුර තුලින් විහිදෙන උතුම් ගායනා කිතුණු ජනතාවගේ හදවතට බෙහෙවින්ම හුරු පුරුදුය. ගීතිකාවේ පියා ලෙස අම්බ්‍රෝසියස් මුනිතුමා සලකනු ලැබේ. ''ගීතිකාව ගායනය දෙවරක් යැදීමක් බව'' අපට පසක් කරනුයේ වේද පරමිත අගුස්තීනු මුනිතුමන්ය. නිර්මල වූ විනයානුකූල වූ ගීතිකා ව ගායනය කිතුනුවන්ට ශාන්තිය ලබාදෙන භක්ති අභ්‍යාසයකි.

පාස්කුව සෑම වසරකම නව වසරක මුල් කාර්තුවේදී එළඹීමෙන් දොම්නස් දින හතළිහකට (40) අපි පිවිසෙමු. ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රී මරණය සිහිපත් කරන්නට හැමගේ යෙදවීම සිදු කරමු. දෙව් මැදුරත් පාදනමස්කාර ප්‍රතිමා කල්වාරි පුදබිමක ස්ථාන ගත කිරීම් හා පාස්කු නාට්‍යය සජීවී දර්ශන ක්‍රිස්තු දුක්ප්‍රාප්තිය මෙනෙහි කරන්නට අපට වන සලකුණුය. ඒ අතරට ශෝකහරිත ගීතිකා ක්‍රමයක් ව්‍යාප්තිය තුල දැහැන් ගත වන්නට යෝග්‍ය වන කාලය චතාරිකය වනු ඇත.

ඉතාමත් සරලව පැබැඳුමට උචිත තනු නිමැවුමකින් විමෝචනය වූ "කුරුසිය මත දිවි පිදුවා'' ලසෝ ගීතය තුල හලාවත මාදම්පා මධ්‍ය මහ විදුහලේ සංගීත උපදේශකව සිටි **ඩී. පී. එල් මහීපාල මහතා** විසින් සකස්කරන ලද බව ඉපැරණි භක්ති ප්‍රබෝදනයෙහි සදහන් වේ. එතුමාට අපේ ගෞරවය පුදකරමින් එම ගීතිකාව ගයන්නට හැකිවන පරිදි මෙසේ ලියා දක්වමි.



කුරුසිය මත දිවි පිදුවා.

ා (ආව සහ තනුව:- හලා/මාදම්පා මධ්‍ය මහා විද්‍යාලයේ සංගීත උපදේශක D. P. L. මහීපාල විසිනි.

CHORUS

කු රු සි ය ම ත දි වි පි දු වා ශ්‍රී ලේ ද ස අ ත ගැ ලු වා.

SOLO

1. ග ව මැ දු ර ක උ ප ත ල බා සැ ම ර ජ ව රු පැ ර දු වා
ආ මා ගේ ජේ සු නි ඔ බ ම ය දෙ ලො ව ම ර ජි දු.

2. අඳුරුවූ ලෝකෙක ඉපදී හිසි මග සතුනට පෙන්වූ
ආ-මාගේ ජේසුනී—ඔබ අප ආලෝකයවේ.

3. පව්බර ඔබ කර පටවා කල්වරි කඳු මත ඇඹුවා
ආ-මාගේ ජේසුනී—අප හට වුව මැනව සමා.

4. නිවවූ මරණෙට ලක්වී සොරු දෙදෙනෙකු මැද එල්ලී
ආ-මාගේ ජේසුනී—මාවනු බෑ හද ශෝකේ.

මහ සිකුරාදාව පමණය

5. අද වැනි දිනයක සිදුවූ ලෝ කම්පාවක ගිල්වූ
ආ-මාගේ ජේසුනී—කෙලෙසක අපි සැහ සෙම්දේ.

**රුපස් ෆ්‍රැන්සිස්** - පයාගල